# පාලිත ගේ ඇසිපිය

## එය අපූරු කවි පොතක්




කවරය වරුණ සාවින්ද



### ඇසි පිය

**නොරට සිට නෙත වසා**
**මව් බිම හඟිමි**
**නෙත හැර බැලූ කල**
**නොරටම හිඳිමි....**

වට වැස්ස නිසාවෙන්
මඟ දෙපස සරසවන
සුපිපි මල් දෙස බලා
ඇවිද යම් මාවතේ
විලුඹ තෙක් මඩ එරුණ

**කලකට** පසු අපූරු කවි පොතක් කියවූයෙමි. ඒ පාලිත ගනේවත්ත නම් වන සොඳුරු නිර්මාණකරුවා සිය නිර්මාණ සංචාරයේ අපූරු සන්ධිස්ථානයක් සනිටුහන් කරන ඇසි පිය කාව්‍ය සංග්‍රහයයි.

ඇසි පිය පාලිත ගනේවත්ත ගේ නිර්මාණ දිවියේ සංධිස්ථානයකි. ජපන් හයිකු කවියට පෙම් බැඳි නිර්මාණකරුවකු වන ඔහු සිය කවිය හයිකු කවියෙන් ඔබ්බට ගෙන යන්නේ ශූර ලෙසිනි.

දිවා රැය එක ලෙසින

කවියක වචනාර්ථයෙන් ඔබ්බට ගිය සංවේදනා මැවිය හැකි වන්නේ ශූර නිර්මාණ කරුවකුට ම පමණි. මෙදා පාලිත ඒ සියලු කඩ ඉම් පැන යන්නේ කිසිදු අපහසුවකින් තොරවය.
සැප්තැම්බර් 11 මැයෙන් යුතු මේ නිර්මාණය ඔබ විඳගන්නේ කෙසේ ද?

නිව්යෝර්ක් නුවර
උසම දෙකුළුණ
බිම හෙළී
දහස් දන හද නැවතිණ

දෙකුළුණ මුවා කළ
හිරු රැස
සුන් බුන් මත වැටිණ

මේ කුඩා කව ඔස්සේ ඔබට කොයිතරම් දුරක් යන්නට හැකි ද? කොයි තරම් චිත්ත රූප මවා ගත හැකි ද?

කවියක් රස ජනනයට පාදක වන්නේ නිර්මාණකරුවා යොදාගන්නා වචන සංඛ්‍යාව නොවේ. අවම වචන සංඛ්‍යාවකින් සුවිශාල චිත්ත රූපයක් කියවන්නා ගේ සිත තුළ මවන්නට නිර්මාණ කරුවකුට හැකි වන්නේ ඔහු සිය මාධ්‍යය නිසි ලෙස අවබෝධ කරගෙන තිබෙයි නම් පමණකි. ඇසි පිය තුළින් පාලිත මවනා පෙළහර අපට පෙන්වා දෙන්නේ ඔහු කොපමණ පරිනත කවියකු වී සිටින්නේ ද යන්නයි.

**සුවඳ හා අඳුර**

කවුළුවෙන් අඩ විවර
සුවඳ මල් මුසු දැනුණ
හඟින්නට මහත් සේ
මුළු දොර ම ඇරිය සඳ
නිවිණි මැටි පහන් සිල
ගිලිණි අඳුරෙහි නිවස

වරුණ සාවින්දගේ කවරය ද පොතට අලංකාරයකි..

පාලිත අනලස්ව නිර්මාණකරණයේ යෙදෙන කවියෙකි. එනිසා ම තමාගේ මාධ්‍යය පිළිබඳ මනා අවබෝධයක් හා හැකියාවක් ඔහු එක් රැස්කර ගෙන සිටියි. තවත් මෙවැනි සාර්ථක නිර්මාණ අපට දායාද කරන්නට ඔහුට හෙට දිනයේ හැකි වනු ඇත්තේ එනිසාම ය. එදා සිටම ඔහුගේ කවි කියවන අපට ඔහුගේ මේ ගමන මහත් ආශ්වාදයක් ගෙන දෙයි

**ජගත් ජේ එදිරිසිංහ**


### කාව්‍යෙන් ගිලිහෙන සංකල්පනා





